B

# නිවේදනය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් කරන ලද "තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

පනත් කෙටුම්පතෙහි,

5(1)(ඒ) වගන්තිය මඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3, 4, 12(1) සහ 14අ(2) යන ව්‍යවස්ථා උල්ලංඝනය වන බවත්,

9(2)(අ) වගන්තිය මඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3, 4, 12(1) සහ 14 යන ව්‍යවස්ථා උල්ලංඝනය වන බවත්,

19 වගන්තිය මඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3, 4, 12(1) සහ 55 යන ව්‍යවස්ථා උල්ලංඝනය වන බවත්,

43(ඒ) සහ 43(ඔ) වගන්ති මඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3, 4 සහ 14අ යන ව්‍යවස්ථා උල්ලංඝනය වන බවත්,

එකී වගන්ති දැනට පවතින ආකාරයෙන්ම සම්මත කළ හැක්කේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ විශේෂ බහුතර ඡන්දයකින් පමණක් බවත් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

තවදුරටත්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත්තේ, ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ දැක්වෙන පරිදි එකී වගන්ති සංශෝධනය කළහොත් ඒවායේ අනනුකූලතාවයන් ඉවත්වනු ඇති බව සහ සරල බහුතර ඡන්දයකින් සම්මත කළ හැකි බවයි.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරමි.